සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2019
# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

7 ශ්‍රේණිය | කාලය පැය 1 ½ යි

නම/ විභාග අංකයඃ

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

---

## A - කොටස

- හිස්තැනට සුදුසු වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

01. "Thank You" යන වචන දෙක අතර ඉඩ තැබීමට භාවිතා කර ඇත්තේ .................... යතුරයි.
    (1) Enter (2) Space (3) Tab (4) Ctrl

02. පළමු පරම්පරාවේ භාවිතා කරන ලද ඉලෙක්ට්‍රොනික තාක්ෂණය වනුයේ,
    (1) අනුකලිත පරිපථ (2) රික්තක නළ (3) ට්‍රාන්සිස්ටර් (4) ක්ෂුද්‍ර පරිපථ

03. පරිගණක තිරය මත අක්ෂර ලිවීම සඳහා භාවිතා කරනු ලබන උපාංග වන්නේ ............................ යි.
    (1) මූසිකයයි (2) මුද්‍රණ යන්ත්‍රය (3) යතුරු පුවරුව (4) සුපිරික්සකය

04. ක්‍රමලේඛනයේ දී අගයන් තාවකාලිකව මතකයන් තුළ තැම්පත් කිරීම සඳහා .......................... යොදා ගැනේ.
    (1) පාලන ව්‍යුහයන් (2) ගැලීම් සටහන් (3) විචල්‍යයන් (4) ඇල්ගොරිතම

05. පරිගණකවල භාවිතා වන මෙහෙයුම් පද්ධතියක් නොවන්නේ,
    (1) මයික්‍රොසොෆ්ට් ඩොස් (MS DOS)
    (2) මයික්‍රොසොෆ්ට් ඔෆිස් (Microsoft Office)
    (3) මයික්‍රොසොෆ්ට් වින්ඩෝස් (Microsoft Windows)
    (4) මැක් ඕඑස් (MAC OS)


06. ඇල්ගොරිතමයක ඇති උපදෙස් එකක් හෝ කීපයක් නැවත නැවත ක්‍රියාත්මක වීම .......................... ලෙස හඳුන්වයි.
    (1) අනුක්‍රමය (2) වරණය (3) පුණර්කරණය (4) තේරීම

07. යතුරු පුවරුව දෙස නොබලා වේගයෙන් හා නිවැරදිව යතුරු හැසිරවීම .......................... යතුරුකරණයයි.
    (1) ස්පර්ශ (2) ඉක්මන් (3) පහසු (4) නම්‍යශීලී

08. යතුරු පුවරුවක දකුණුපස ඇති අංක සහිත කොටස වැඩ කරන අවස්ථාවට සම්බන්ධ යතුර මින් කුමක් ද?
    (1) Num Lock (2) Scroll Lock (3) Caps Lock (4) esc

09. විද්‍යුත් සමර්පන නිර්මාණය සඳහා භාවිතා කළ හැකි මෘදුකාංගයකි,
    (1) Open Office impress (2) MS Word
    (3) Paint (4) Photoshop

10. ඔබට වදන් සැකසුම් මෘදුකාංගය තුළ Capital අකුරු (ලොකු අකුරු) වලින් පමණක් යතුරු ලියනය කළ යුතුව ඇත. ඒ සඳහා පළමුව සක්‍රීය කළ යුතු යතුර වන්නේ,
    (1) 

    (2) 

    (3) 

    (4) 


(2 x 10 = 20)

- **පහත සඳහන් වාක්‍ය හොඳින් කියවා බලා හරි නම් ''✓'' ලකුණ ද වැරදි නම් ''x'' ලකුණ ද වරහන් තුළ යොදන්න.**

11. MS Word භාවිතයේ දී Enter යතුර තද කිරීම මගින් කර්සරය පහළට යයි. (........)
12. ගොනු බහාලුම තාවකාලිකව මකා දැමීම සඳහා, මකා දැමීමට අවශ්‍ය ගොනු බහාලුම තෝරා ඉන්පසු යතුරු පුවරුවේ ctrl යතුර එබිය යුතුය. (........)
13. හතරවන පරම්පරාවේ පරිගණකයේ ප්‍රමාණය තුන්වන පරම්පරාවේ එහි ප්‍රමාණයට වඩා කුඩාය. (........)
14. පාවහන් ගලවා පරිගණක විද්‍යාගාරයට ඇතුළු වීම මගින් ඒ තුළ වැලි, දූවිලි ආදියෙන් තොර පරිසරයක් පවත්වාගත හැකිය. (........)
15. Microsoft Power Point යනු වදන් සැකසුම් මෘදුකාංගයකි. (........)

(2 x 5 = 10)

- **''අ'' කොටසට ගැලපෙන පිළිතුර ''ආ'' කොටසින් තෝරා යා කරන්න.**

| | ''අ'' | ''ආ'' |
|---|---|---|
| 16. | ජංගම දුරකථන වල භාවිතා වන මෙහෙයුම් පද්ධතියකි. | ALU |
| 17. | මුල්වරට ලේඛනයක් සුරැකීමට .................... භාවිතා කරයි. | CCTV |
| 18. | ක්‍රමලේඛ දෝෂයක් හඳුන්වනුයේ, | Android |
| 19. | සොර සතුරු වලින් පරිගණක ආරක්ෂා කිරීම සඳහා භාවිතා කරයි. | bugs |
| 20. | පරිගණකය තුළ සියලුම ගණිතමය හා තාර්කික මෙහෙයුම් සිදු කරයි. | Save |

(2 x 5 = 10)

## B - කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**


(01) පහත දැක්වෙන ආචයන උපක්‍රම හඳුනාගෙන පහත වගුවට නිවැරදිව ඇතුළත් කරන්න.

Hard disk — CD
External hard disk — Memory card
DVD — Pen drive

| චුම්භක මාධ්‍ය උපක්‍රම | ප්‍රකාශ මාධ්‍ය උපක්‍රම | ඝන තත්වයේ මාධ්‍ය උපක්‍රම |
|---|---|---|
| | | |
| | | |

(2 x 6 = 12)

(02) මෙහි දක්වා ඇති ආකාරයෙන් යතුරු භාවිතයෙන් යතුරු ලියනය කලවිට ලැබෙන ප්‍රතිඵල ලියන්න.

a. 

=..............

b. 

=..............

c. 


=..............

d. 

=..............

(3 x 4 = 12)

(03) (i) පහත ගැලීම් සටහනේ A, B, C, D මඟින් දක්වා ඇති සංකේත වලින් නිරූපණය වන අවස්ථා වරහන් තුළින් තෝරා ලියන්න. (ආදානය, ආරම්භය, නිමාව, තීරණය)




(ලකුණු 1.5 x 4 = 6)

(ii) ඍජුකෝණාස්‍රයක පරිමිතිය දැක්වීමට සුදුසු ගැලීම් සටහනක් ඇඳ දක්වන්න.

(ලකුණු 06)

(04) (i) මෙහෙයුම් පද්ධතිය මගින් සිදුකරන කාර්යන් 02 ක් ලියන්න. (ලකුණු 02)

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(ii) මධ්‍ය සැකසුම් ඒකකයේ ප්‍රධාන කොටස් 3 නම් කරන්න. (ලකුණු 06)

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(3) ..........................................................................................................

ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 04)

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

(05) (i) පරිගණකය භෞතික හානි වලින් ආරක්ෂා කර ගැනීම සඳහා සිදුකල හැකි ක්‍රියාමාර්ග 03 ක් ලියන්න.

(1) ........................................................................................................................

(2) ........................................................................................................................

(3) ........................................................................................................................

(ලකුණු 2 x 3 = 06)

(ii) පරිගණක විද්‍යාගාරය තුළ ඔබ සතු විය යුතු යහපත් පුරුදු 03 ක් ලියන්න.

(1) ........................................................................................................................

(2) ........................................................................................................................

(3) ........................................................................................................................

(ලකුණු 2 x 3 = 06)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **දෙවන වාර පරීක්ෂණය 2019**

**7 ශ්‍රේණිය** **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය**

**පිළිතුරු පත්‍රය - A කොටස**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(2) | 3 -(3) | 4 -(3) | 5 -(2) | 6 -(3) | 7 -(1) | 8 -(1) | 9 -(1) | 10 -(2) |

11. ✓ 14. ✓ 16. Android 19. CCTV
12. X 15. X 17. Save 20. ALU
13. ✓ (2 x 5 = 10) 18. bugs (2 x 5 = 10)

**B - කොටස**

(01)


| චුම්භක මාධ්‍ය උපක්‍රම | ප්‍රකාශ මාධ්‍ය උපක්‍රම | ඝන තත්වයේ මාධ්‍ය උපක්‍රම |
|---|---|---|
| Hard disk | CD | Pen drive |
| External hard disk | DVD | Memory card |

(2 x 6 = 12)

(02) a. A b. aB c. cAB d. Cat (ලකුණු 1.5 x 4 = 6)

(03) (i) A - ආරම්භය B - ආදානය C - තීරණය D - නිමාව

(ii) (ලකුණු 06)




(හෝ පරිමිතිය = දිග + දිග + පළල + පළල)

(ලකුණු 06)

(04) (i) පරිශීලකයාට පරිගණකය සමඟ පහසුවෙන් සම්බන්ධ වීම සඳහා පරිශීලක අතුරු මුහුණතක් (user interface) සපයයි, මධ්‍ය සැකසුම් ඒකකයේ (CPU) කාර්ය පාලනය කරයි, පරිගණකයේ මතකය (memory) නිසිලෙස හසුරුවයි, දෘඩාංග මෙහෙයවීම සිදු කරයි, ආචයන උපාංගවලට (storage devices) අදාළ ක්‍රියා පාලනය කරයි, ගොනු හා ගොනු බහාලුම් නිසි ලෙස සැකසීමට අදාළ කටයුතු කරයි. පරිශීලක ගිණුම් (user name) හා මුරපද (password) මඟින් පරිගණකයේ සුරක්ෂිතභාවය ඇති කිරීමට උපකාරී වේ. යනාදී කරුණු වලින් 02 ක්. (ලකුණු 02)

(ii) ගණිතමය හා තාර්කික ඒකකය (Arithmetic & Logical Unit)
පාලන ඒකකය (Control Unit)
මතක රෙජිස්තර (Memory registers) (ලකුණු 06)

ගණිතමය හා තාර්කික ඒකකය : ගණිතමය හා තාර්කික ක්‍රියාවන් සිදු කරනු ලබන්නේ ගණිතමය හා තාර්කික ඒකකය මඟිනි. කොටස් 02 කි. ගණිතමය කාර්යය, තාර්කික කාර්යය. උදාහරණ සඳහන් නම් මුළු ලකුණු ලබාදෙන්න.

හෝ

පාලන ඒකකය : පරිගණකයට සම්බන්ධ කර ඇති දෘඩාංග අතර සන්නිවේදනය, මෙහෙයවීම හා පාලනය සිදු කරයි. එය ආදාන හා ප්‍රතිදානයන්හි දත්ත පාලනය, දත්ත සුදුසු ස්ථානයට නිවැරදි වේලාවට යැවීම තහවුරු කිරීම හා අදාළ සංඥා සාර්ථකව ලැබෙන්නේදැයි විමසිලිමත් වීම යන කාර්යය සිදුකරයි.

හෝ

මතක රෙජිස්තර : මධ්‍ය සැකසුම් ඒකකය භාවිතා කරමින් සිටින දත්ත සහ උපදෙස් තාවකාලිකව රඳවා තබාගන්නා ස්ථානයයි. මෙහි ධාරිතාව අනෙකුත් පරිගණක මතක සමඟ සසඳන විට කුඩා අගයක් නමුත් වේගය වැඩිය. (ලකුණු 04)

(05) (i) විද්‍යාගාරයට පාවහන් රහිතව ඇතුළු වීම, විද්‍යාගාරය තුළ ආහාර පාන නොගැනීම, කෘමීන් මීයන් වැනි සතුන් විද්‍යාගාරයට ඇතුළු වීම වැළැක්වීම, විද්‍යාගාර පිරිසිදුව තබා ගැනීම, හැකි සෑම විටම වායු සමීකරණය භාවිතා කිරීම, තෙතමනයෙන් තොරව තබා ගැනීම, දූවිල්ලෙන් ආරක්ෂා කිරීම වැනි ක්‍රියා මාර්ග 02 ක්. (ලකුණු 2 x 3 = 06)

(ii) අන් අයට බාධාවක් නොවන ලෙස අපගේ පරිගණක භාවිතා කළ යුතුය, අන් අයගේ පරිගණක ක්‍රියාකාරකම්වලට අනවසරයෙන් මැදිහත් නොවිය යුතුය, මුදල් ගෙවා භාවිතා කළ යුතු මෘදුකාංග එසේ නොකොට වංචනික ලෙස භාවිතා කිරීම හෝ පිටපත් කිරීම නොකළ යුතුය, අන් අයගේ පරිගණක ගොනු හා ලිපි රහසේ බැලීමෙන් හා උපුටා ගැනීමෙන් වැළකිය යුතුය, ගුරු භවතුන්ගේ අධීක්ෂණයෙන් තොරව අන්තර්ජාලය භාවිතා නොකළ යුතුය, ගුරුභවතුන්ගේ උපදෙස්වලින් තොරව කිසිම වැඩසටහනක් මකා නොදැමිය යුතුය, පරිගණක උපාංග නිසි උපදේශයින් තොරව නඩත්තු කිරීම නොකළ යුතුය. (ලකුණු 2 x 3 = 06)